**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය**
---------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මතය**
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සි ක්ලාක් ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සි ක්ලාක් ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-------------------------------------

1.2.1 **උසස් ගිණුම්කරණ පරිචයන්**
-------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(i) මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ආයතනය විසින් අනුගමනය කරණු ලබන සියළුම ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(iii) ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වූ වාහන 06 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**
-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) භාණ්ඩාගාර බිල්පත් ආයෝජනවල පොලී රු.35,192 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු රු.මිලියන 10 ක් වූ භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මුදල් සහ මුදල් සමාන වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii) පාඨමාලා වියදම්, ව්‍යාපෘති වියදම් සහ විදාතා වැඩ සටහන් වියදම් වශයෙන් පිළිවෙලින් රු. 4,376,575 රු. 1,215,436 රු. 1,267,669 ක වියදමක් ගිණුම්වල පෙන්වා තිබුණද වියදම් වර්ගීකරණ විස්තර නොතිබුණි.

**1.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

-----------------------

(i) රේඛීය අමාත්‍යාංශයේ විදාතා වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් ලැබිය යුතු රු.267,136 ක මුදල අයකර ගෙන නොතිබුණි.

(ii) වර්ෂ 03 ක් ඉක්මවන රු.73,172 ක් වූ ණයගැති ශේෂ 06 ක් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) රු.5,783,422 ක් වූ ණය ගැතියන් සම්බන්ධයෙන් සනාථ කිරීම් ලබා නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

------------------------

(i) ශ්‍රී ලංකා ඉන්වෙන්ටර්ස් කොමිසම වෙත ගෙවිය යුතු රු.145,510 ක් වසර තුනක කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ii) රු.491,457ක් වූ ණය හිමියන් සම්බන්ධයෙන් සනාථ කිරීම් ලබා නොතිබුණි.

**1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයට නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ 104 | වාහන අනතුරු තුනක් සම්බන්ධයෙන් අදාල පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ii) මු.රෙ 371(2) | රු.20,000 ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණ අතර රු.252,000 ක් වූ අත්තිකාරම් 06 ක් පියවීමට මාසයකට වැඩි කාලසීමාවක් ගත වී තිබුණි |
| (iii)මු.රෙ.395 (ඇ) | යම් මාසයක් අවසන් වී ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් සකස් කර ඉදිරිපත් කළයුතු වුවද ආයතනයේ බැංකු ගිණුම් 4 ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iv)මු.රෙ 751,753 සහ804 | ආයතනයේ විවිධ අංශ වලට නිකුත් කරනු ලබන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) මු.රෙ 760 සහ 770 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා ප්‍රකාරව නැතිවූ භාණ්ඩ සහ පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(vi) මු.රෙ 802හා1647(ඉ) — යොමුගත රෙගුලාසි ප්‍රකාරව වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) චක්‍රලේඛ

----------

(i) 2003 ජුනි 02 දින අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

5.2.1 වගන්තිය — වාර්ෂික අයවැය ලේඛනය සමඟ අයවැයගත ශේෂ පත්‍රය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළයුතු වුවත් එසේ කර නොතිබුණි.

9.2 වගන්තිය — අනුමත සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ පර්පාටිය හා සංවිධාන සටහන සකසා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) 2006.08.23 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 — බඳවා ගැනීම් පටිපාටි අනුමත කරගෙන නොතිබුණු අතර සමහර තනතුරු සඳහා වැටුප් සැකසීමේදි සාවද්‍ය වැටුප් පියවරයන් මත ගෙවීම් කර තිබුණි.

### 1.2.5 ප්‍රමාණවත් අධිකාර් බලයෙන් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------

ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.571,712 ක මුදල අධ්‍යක්ෂ මණඩල අනුමැතිය මත ගිණුම්වලින් කපා හැර තිබුණද, මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### 1.2.6 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

-----------------------------

පාඨමාලා ක්‍රියාත්මක කිරීමෙන් ලබන ආදායම් මුදල් චක්‍රීය අරමුදලකට බැර කර එමගින් වැයදැරීම් සිදුකළ යුතු බව හා ඒ සඳහා පොදු රෙගුලාසි මාලාවක් සකස්කර අනුමත කරගත යුතු වුවද එසේ නොකර ව්‍යාපෘතීන් සහ පාඨමාලා වලින් ලද අතිරික්තයෙන් රු.2,167,143 ක මුදලක් ආයතනයේ නිලධාරීන් කිහිප දෙනෙකු අතර වැටුපට අමතරව බෙදාහැර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

-------------------

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.46,985,355 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.44,755,129 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණ රු.52,850,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොටගෙන, මූල්‍ය ප්‍රතිඵලය රු.5,864,645 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.50,925,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොටගෙන එම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,169,871 ක අතිරික්තයක් වී තිබුණි.

### 2.1.2 මූල්‍ය තත්වය

--------------

සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතනයේ කාරක ප්‍රාග්ධනය රු.61,922,000 ක් වූ අතර ඉකුත් වර්ෂය අවසානයේදී ඊට අනුරූපී කාරක ප්‍රාග්ධනය රු.37,435,000 ක් වූයෙන් කාරක ප්‍රාග්ධනයෙන් රු.24,487,000 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. ණයගැති ශේෂ වැඩිවීම සහ පෙර ගෙවීම් ශේෂ වැඩිවීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත අතර, කාරක ප්‍රාග්ධනය ප්‍රශස්ථ මට්ටමට ගෙන ඒමට කළමනාකරණය පියවර ගෙන ඇති බවට සාක්ෂි නොවීය.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උපකරණ, පරිභෝගික භාණ්ඩ, ව්‍යාපෘති භාණ්ඩ සහ පොත් මිලදී ගැනීමට අවුරුදු 04 කට පෙර රු.225,981 ක බැංකු ණයවර ලිපි නිකුත් කර තිබුණද, එම භාණ්ඩ මේ වන තෙක් ආයතනයට ලැබී නොතිබුණි.

(ii) 2010 වර්ෂය අවසානයේදී රු.3,727,077 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ගෙවා තිබුණද එම භාණ්ඩ 2011 අප්‍රේල් 28 දින වන විටත් ආයතනයට ලැබී නොතිබුණි.

(iii) විධිමත් ඇස්තමේන්තුවකින් තොරව අවශ්‍ය ප්‍රමාණයට වඩා අත්තිකාරම් ලබාදීම නිසා මුළු වියදම රු.221,817 ක් වූ අත්තිකාරම් 10 කට රු.389,000 ක් ලබාදී තිබුණි.

(iv) නස්ඩා ව්‍යාපෘතියේ (Nasda project) අරමුණුගත කාර්යයන් සඳහා ලැබුණු මුදල් ඒ සඳහා ප්‍රයෝජනයට නොගෙන වර්ෂය අවසානයේදී රු.400,000 ක් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි.

### 2.2.2. නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| වත්කම | වටිනාකම | විස්තරය |
|---|---|---|
| | රු. | |
| (i) පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවල ඉතිරි පාරිභෝජන තොග අයිතම් 44 ක් සහ පරිගණක උපාංග තොග අයිතම් 52 | | 2005 වර්ෂයේ සිට භාවිතා කර නොතිබුණි. |
| (ii) රොබෝ සංචාලක යන්ත්‍රය | 2,700,000 | 2009 වර්ෂයේදී මිලදී ගත් මෙම යන්ත්‍රයෙන් අපේක්ෂිත අරමුණු සඳහා යොදවා ගෙන නොතිබුණි. |

### 2.2.3 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

භාණ්ඩ හා සේවා ලබා ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට ගෙවා ඇත. රු. 225,981 ක් වූ බැංකු ප්‍රේෂණ එම සැපයුම්කරුවන් නොමැති හෙයින් අයකරගත නොහැකිව තිබුණි.

### 2.2.4 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

--------------------------------------

2003 ජූනි 12 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 ප්‍රකාරව සකස් නොකල සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කරමින් ක්‍රියාකාරී තත්වයට ගෙන නොතිබුණි.

### 2.2.5 විගණන හා කළමනාකරණ කමිටුවල ක්‍රියාකාරීත්වය

----------------------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 2.2.6 අයවැය පාලනය

----------------

මහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබූ රු.21,770,000 ක ප්‍රාග්ධන හා රු.52,850,000 ක පුනරාවර්තන අරමුදල් සම්බන්ධයෙන් වැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

i. අත්තිකාරම් ලබාදීම හා පියවීම
ii. ණයගැති හා ණයහිමි පාලනය
iii. අයවැය පාලනය
iv. තොග පාලනය
v. බැංකු සැසඳුම් පිළියෙල කිරීම
vi. වාහන භාවිතය හා ලේඛන නඩත්තුව
vii. විවිධ තැන්පතු ලේඛනගත කිරීම